116583
02.12.91

# විධිමත් හා අවිධිමත් අධ්‍යාපන ක්‍රියාවලියේලා බෞද්ධ භික්ෂුවගේ කාර්ය භාරය

CR
ලංකා
ශාලාව

(සමාජ විද්‍යාත්මක විග්‍රහයක්)

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යනාංශයේ ශාස්ත්‍රපති(සමාජ විද්‍යාව) උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන නිබන්ධය

116583

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යනාංශය,
නුගේගොඩ.
1990-10-31

විභාග අංකය:-
ලේඛනාරූඪ අංකය:-12642

උපාධි අපේක්ෂකයාගේ නම: පූජ්‍ය කහවත්තේ අනන්ද හිමි.

110

LB/Don/63/91

5315/2005/8433
2011 K7
2015 4
2020 P

CR

CR CR
ලංකා 370.1
ANA

116583

# ROLE OF THE BUDDHIST MONK IN FORMAL AND NON FORMAL EDUCATION

THESIS SUBMITTED TO THE UNIVERSITY OF SRI JAYEWARDENEPURA IN FULFILMENT OF THE REQUIREMENT OF THE DEGREE OF ARTS (SOCIOLOGY)
1990

10
06-11-1990

CR

116583

UNIVERSITY OF SRI JAYEWARDENEPURA
NUGEGODA

## පිදුම

මා ඇති දැඩි කළ දෙමවුපියන්ටද,
සිප් සතර ලබාදුන් අස්මදාචාර්යවරුන්ටද,
බැතිබර සිතින් මේ ග්‍රන්ථය පිරිනැමේ.

## මාගේ කෘතඥ සැලකුම.

සමාජවිද්‍යා කෞතුකයට මා යොමුකොට සමාජය පිළිබඳ යථාර්ථය ස්වරූපය තේරුම් ගැනීමට මඟපෙන්වා දී මෙම පර්යේෂණ නිබන්ධය සඳහා ආධාරය පිණිසකම කරුණු පැහැදිලිකර දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය කන්දදෙණිය රත්නපාල මහතා සහ සාහිත්‍ය ශූරී කන්දදේව විශේෂඥ මහතාන් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

අධ්‍යයන කටයුතුවලදී සහාය දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන එච්.ඩී. ජේ. ගමිනිගම, කථිකාචාර්යනී යසාංජලි දේවිකා පෙරේරා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති ටී.එම්.ප්‍රේමසිරි යන මහත්ම මහත්මීන් සිහිපත් කරන්නේ හෘදපිරි දයාවෙනි.

මාගේ අධ්‍යයන කටයුතු සඳහා මුල සිටම පහසුකම් සලසමින් මෙම නිබන්ධයේදී අවශ්‍ය යෝජනා ද සපයාදී ආරම්භයේ සිට මේ පිළිබඳව අයාමැලිමෙන් තොරව මා දිරිමත් කළ රත්නපිටිය පරමාර්ථසිද්ධිකාරාමාධිපති ශාස්ත්‍රවේදී පූජ්‍ය ගරු මොරන්ගොඩැල්ලේ පඤ්ඤානන්ද ලොකු හාමුදුරුවන්වහන්සේ සිහිපත් කරන්නේ බැතිසිත් පෙරටුවයි.

මෙම නිබන්ධය සඳහා අවශ්‍ය දත්ත සපයා ගැනීමේදී උපකාර කළ බ/බිබිලේගම පරිසද මූලස්ථ විද්‍යාලයේ විදුහල්පති ලොකු පේරන්, ශාස්ත්‍රාචාර්ය ජේ.ම්.එච්.බණ්ඩාර, ජයන්ත සෙනෙවිරත්න, ගුරුභාරතී ලීලා අබේරත්න, බ/මැදගමගොල්ල මහවිද්‍යාලයේ ආචාර්ය සම්පත් විජයය, ජේ.ඇම්.මල්කාන්ති භූගෝලීය කාර්යය පිළිබඳ උපදෙස් දුන් බ/බිබිලේගම පරිසද මූලස්ථ විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති භූගෝල විද්‍යා ආචාර්ය ශාස්ත්‍රාචාර්ය ඩී.ඇම්.විජේපාල, පුස්තකාලයාධිපති එච්.ඇම්.ජයසේන යන මහත්ම මහත්මීන් සිහිපත් කරන්නේ හදපිරි සතුටිනි.

සෙසු කටයුතු වලදී සහාය දුන් වැලිමඩ කැප්පෙටිපොල ශ්‍රී සෝමානන්ද මහ පිරිවෙනේ පරිවේණාධිපති ඌව ශ්‍යාමවංශික මහ නිකායේ මහනායක අතිපූජ්‍ය පාලුගම සුමනසාරාභිධාන මහනායක මාහිමිපාණන්වහන්සේගේ පරිවේණාචාර්ය ශාස්ත්‍රවේදී පූජ්‍ය ගරු වැටමීරේ සෝරත, පූජ්‍ය විලම්බ පඤ්ඤාතිලක යන හිමිවරුන් ද මහරගම ශ්‍රී වජිරඤාණ ධර්මායතනාධිපති අති පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනායක මාහිමිපාණන්වහන්සේගේ උපකාරය ගෞරවයෙන් සිහිපත් කරමි.

කොළඹ ශ්‍රී ලංකා ජාතික රූපවාහිනී සංස්ථාවේ ආගමික අංශයේ චන්ද්‍රරත්න එදිරිසිංහ, පර්යේෂණ අංශයේ පී. ජී. ධර්මදාස, එම්. ජී. ප්‍රේමනායක සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ කුමාර රත්නායක යන මහත්වරුන් කරුණා පෙරදැරිව සිහිපත් කරමි.

මෙම නිබන්ධයේ දී සිතියම් හා ප්‍රස්තාර සටහන් ඉක්මනටත් ලස්සනටත් සකස් කර දුන් බිබිලේගම "සාගර" නිවසේ සමරු කුමාරි ජයසුන්දර මෙනෙවියත් බ/බිබිලේගම පර්ෂද මූලික මහ විද්‍යාලයේ එදිරිවීර ජයලත් බණ්ඩාර සිසුවාත් ආදරින් සිහිපත් කරමි.

තමන්ගේම වැඩකටයුතු ඉවතලා ඉක්මනටත් ලස්සනටත් අත් පිටපත ලිවීමේදී උපකාර කළ බිබිලේගම "පෙම්සිරි" නිවසේ ජේ. ඇම්. පුෂ්පා ආරියවතී මැණිකේ, නාගවැල්ල "සුපුන්" නිවසේ පුෂ්පලතා වික්‍රමසිංහ යන මෙනවියන් දෙපල ආදරයෙන් සිහිපත් කරමි.

යතුරු ලියනය කිරීමේදී අවිවේකි බව නොතකා එම කටයුතු ඉතාමත් ඉක්මනටත් ලස්සනටත් නිමකර දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ජිනදාස සිටුගේ මහතා කෘතඥපූර්වකව සිහිපත් කරමි.

# පටුන


| | පිටු අංක. |
|---|---|
| **හැඳින්වීම.** | |
| 1. මාතෘකාව හැඳින්වීම | 1 - 5 |
| 2. අධ්‍යයනයේ පරමාර්ථ | 6 - 7 |
| 3. අධ්‍යයනයේ ක්‍රමවේදය | 8 - 15 |
| 4. නියැදිය තෝරා ගැනීම | 15 - 17 |
| 5. දත්ත රාශිකරණයේ ගැටළු | 17 - 18 |
| 6. අධ්‍යයනයේ ක්ෂේත්‍රය | 18 |
| 7. දත්ත විග්‍රහය | 19 |
| **පළමු පරිච්ඡේදය.** | |
| භික්ෂුව හා අධ්‍යාපනය. | |
| 1:1 භික්ෂුව පිළිබඳ ආකල්ප | 20 - 32 |
| 1:2 අධ්‍යාපනය හා භික්ෂුව | 33 - 46 |
| 1:3 පැරණි අධ්‍යාපනයේ ඇති වැදගත්කම | 47 - 62 |
| 1:4 රට විදේශිකයින්ට යටත්වීම සහ පැරණි අධ්‍යාපනය පිරිහීම | 63 - 75 |
| 1:5 ඉංග්‍රීසින් යටතේ භික්ෂු අධ්‍යාපනය | 76 - 81 |
| 1:6 බෞද්ධ අධ්‍යාපනයේ පුනර්ජීවනය | 82 - 88 |
| 1:7 නිදහසෙන් පසු භික්ෂු අධ්‍යාපනය හා සාමාන්‍ය අධ්‍යාපනය | 89 - 93 |
| 1:8 විශ්ව විද්‍යාල හා පිරිවෙන් වලින් ලැබුණු සේවය | 94 - 102 |
| **දෙවන පරිච්ඡේදය.** | |
| බිබිලේගම පිළිබඳ භූගෝල ශාස්ත්‍රීය සමාජීය හා ඓතිහාසික පසුබිම | 103 - 138 |
| **තෙවන පරිච්ඡේදය** | |
| ගම හා භික්ෂුව | 139 - 157 |

සිව්වන පරිච්ඡේදය.

සමාජ ප්‍රශ්න හා භික්ෂූන්වහන්සේ 158 - 176

පස්වන පරිච්ඡේදය.

සන්නිවේදන මාධ්‍ය හා භික්ෂූන්වහන්සේ 177 - 196

සවැනි පරිච්ඡේදය.

හැප්පෙටිපොල පිරිවෙන 197 - 236

හත්වන පරිච්ඡේදය.

සමාජ සේවය හා භික්ෂූන්වහන්සේ 237 - 262

ග්‍රන්ථාවලිය 263 - 281

# 1

## හැඳින්වීම.

### 1. මාතෘකාව හැඳින්වීම.

සමාජය රටයක් වශයෙන් සලකතොත් එම රටයේ වියදුරා වශයෙන් කටයුතු කරනු ලබන්නේ අධ්‍යාපනයයි. මෙයින් අදහස් කරනු ලැබුයේ අධ්‍යාපනයෙන් තොරව සමාජය ගැනත් සමාජයෙන් තොරව අධ්‍යාපනය ගැනත් කථාකළ නොහැකි බවයි. තවදුරටත් සලකා බලන්නේ නම් සමාජයේ පැවැත්මට අධ්‍යාපනය අවශ්‍ය බවයි.

"අධ්‍යාපනය යන්න කිසියම් ක්‍රියාවලියක ප්‍රාප්තියක් ලෙස ආර්.එස්. පීටර්ස් සලකන බව පෙනේ."

මෙයින් පැහැදිලි වන්නේ කිසියම් කාර්ය තොටයකට හුරුවීම අධ්‍යාපනය යන්නෙන් හඳුන්වන බවයි.

> "අධ්‍යාපනය යනු කෙනෙකු උපතේ සිට මරණය දක්වා ලබන අත්දැකීම් සම්භාරයයි."

අධ්‍යාපනය අවසානයක් නොමැති අඛණ්ඩ ක්‍රියාවලියක් බව පැහැදිලි වේ.

> "අධ්‍යාපනය යනු ළමයා තුළ උසස් මානසික ලක්ෂණ ප්‍රගුණ කරවීම සඳහා හිතාමතා කෙරෙන ප්‍රයත්නයක් යයි ආර්.එස්. පීටර්ස් දක්වයි."

මනස දියුණු කිරීම සඳහා ඉගැන්වීම උද්‍යානයෙන් ලබාගත යුතු දෙයක් බව පැහැදිලිවේ.

> "ප්‍රයෝජනවත් ක්‍රියාවලට ළමයා හුරු පුරුදු කිරීම"

මෙයින් පෙනෙන්නේ සමාජයේ යහපත් කාර්ය භාරයකට පුද්ගලයා හුරුකරවනු ලබන ක්‍රියාවලිය බවයි.

" ඇරිස්ටෝටල් අධ්‍යාපනය පිළිබඳව කියා ඇති දෙය අදටද ඒ අයුරුම අදාල බැව් කිව යුතුය. අධ්‍යාපනය මුළු මානව සමාජය සියාරා පැතිරෙන හැම ක්‍රියාවකටම බලපාන අද්විතීය බලවේගයක් යයි පිළිගත හැකිය."[1]

" අධ්‍යාපනයෙන් සිදුවිය යුත්තේ මනුෂ්‍යයාගේ ඒකාන්ත අභිවෘද්ධියයි."[2]

මිනිස් ජීවිතයේ ආලෝකය උදාකරනු ලබන එකම බලවේගය අධ්‍යාපනය බව මෙයින් පැහැදිලිවේ.

සමාජ විද්‍යානුකූලව අධ්‍යාපනය සංස්ථාවක් ඇතිකර ගැනීම හැකිය. මෙම සංස්ථාව තුළින් කරනු ලබන්නේ සංස්කෘතිය නැතිනම් සමාජය පිළිබඳ පුද්ගලයාට කුඩාකල සිට අවබෝධයක් ලබා දීමයි. මෙම අධ්‍යාපනයේ කාර්ය කොටස් 04 කින් දක්වා ඇත.

---

1. හෙන්රි වීරසිංහ, අධ්‍යාපන දර්ශන ප්‍රවේශය, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම, කොළඹ, 1977.

2. ජ.ඩබ්ලිව්.අදිකාරම්, බෞද්ධ අධ්‍යාපනය සහ වෙනත් ලිපි, ජේ.කේ.ජ. ජයවර්ධන සහ සමාගම, කොළඹ, 1957: 11 පිට.

බලන්න:- 1 බඹරැන්දේ සිරි සීවලී අධ්‍යාපනය හා ජීවිතය, විද්‍යාලංකාර විශ්ව විද්‍යාල මුද්‍රණාලය, කැළණිය, 1959.

11 ඩබ්ලිව්.ආර්.පී.සෝමරත්න, අධ්‍යාපන විද්‍යාව පළමු කාණ්ඩය, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1961:12-16 පිටු.

" 1 සමාජයක පවත්නා සංස්කෘතිය පරපුරෙන් පරපුරට එළිදැක්වීම.

11 පුද්ගලයාගේ සමාජ කාර්ය භාරයන් තෝරාගෙන ඒවා මෙසේ කළ යුතු යයි කියා දීම.

111 විවිධ පුද්ගලයන් හා උපසංස්කෘතීන්ට අයත් අය ප්‍රධාන සංස්කෘතියට අනුකූලනය කිරීම.

1v සමාජමය හා සංස්කෘතිකමය වශයෙන් අලුත් නිපදවීම් කිරීමට මුලාශ්‍රවීම."[1]

මෙම කාර්ය ඉටුකරනු ලබන්නේ සමාජයේ ගුරුන් හා දෙගුරුන්ය. ඊට අමතරව ඒ ඒ ආගම්වල ආගමික පූජකයන් වහන්සේලාය.

අධ්‍යාපන සංස්ථාව තුළ ගිහි - පැවිදි වශයෙන් කොටස් දෙකක් ඇත. මේ දෙක අතර ආකල්ප හා අගනාකම් රටාවේ වෙනස්කම් පවතී. එමෙන්ම ඒවා වෙනස්වීම් වලටද භාජනයවීම නිතර සිදුවන දෙයකි. අධ්‍යාපන සංස්ථාව තුළ විධිමත් හා අවිධිමත් ආකාරයෙන් කටයුතු කරන බෞද්ධ භික්ෂුව නියෝජනය කරමින්

"විධිමත් හා අවිධිමත් අධ්‍යාපන ක්‍රියාවලියේදී බෞද්ධ භික්ෂුවගේ කාර්ය භාරය" යන මාතෘකාව මෙම පර්යේෂණ නිබන්ධය සඳහා තෝරා ගතිමි. විශේෂයෙන් බෞද්ධ භික්ෂුව අධ්‍යාපන කාර්යාවලියේදී නියමුවකු වශයෙන් කටයුතු කළ ආකාරය මහින්දාගමනය තෙක් දිවයෙයි කරුණු සාකච්ඡා කිරීමට අදහස් කෙළෙමි.

මිහිඳු හිමියන්ගේ ලංකාවතරණයත් සමගම ඇතිවූ අධ්‍යාපන ක්‍රියාවලිය රටේ ඇතිවූ බාහිර හා අභ්‍යන්තර යම් යම් ආපදා අවස්ථාවලදී භික්ෂුව තුලින් නැතිවී ගියත්, භික්ෂුව සිය ජීවිත පරිත්‍යාගයෙන් හා කැපවීමෙන් යුක්තව ආරක්ෂා කරගෙන එනු ලැබීය. එහි ප්‍රතිඵලයක් වශයෙනි වෙහෙර විහාරස්ථාන අධ්‍යාපන ශාලා බවට

1. නන්දසේන රත්නපාල, සමාජ විද්‍යාවේ මූලධර්ම, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, කොළඹ, 1986: 39-40 පිටු.

පත්විය. බෞද්ධ භික්ෂූන්වහන්සේ නාවත් ගුරුවරයා විය. විහාරස්ථානවල ධර්ම පුස්තකාල බිහිවිය. ගමේ දරුවාට අකුරෙන් තැබීමට භික්ෂුව නැතිවම බැරිවිය. ගමේ සමාජයේ නායකත්වය භික්ෂුවට හිමි වූයේ උන්වහන්සේගේ උගත්කමේ තරමටයි. ගිහි ජනයා භික්ෂුව සැලකුයේ සර්ව ශාස්ත්‍ර දත් කෙනෙකු හැටියටයි. කරණීය මෙත්ත සූත්‍රයේදී පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණ දක්වන බුදුරදුන් පළමුවෙන්ම දක්වූයේ "සක්කො"[1] නැති නම් හැකියාව කියන ගුණයයි. එය ඒ අයුරින්ම පවත්වාගෙන ඒමට භික්ෂුව උත්සාහ ගත්හ. ඒ නියාම අනුරාධපුර යුගයේ පමණක් නොව අදත් ලංකාවේ චිත්‍ර ශිල්පය, ප්‍රතිමා කලාව, ග්‍රන්ථ රචනය, ගීත රචනය හා ශෛලමය කැටයම් කලාව ආදිය සිදුකරනු ලබන භික්ෂූන් සොයාගත හැකිය.

මේ සඳහා භික්ෂුව පළමුවෙන්ම සුදුස්සෙකු බවට පත්විය. එනම් අධ්‍යාපනය අතින් දියුණු තත්වයට පත්වීමට උත්සාහවත්විය. ඒ සඳහා උන්වහන්සේට විවේකය ඇතුළු වෙනත් පහසුකම්ද තිබිණ. එහෙත් ලාංකික බෞද්ධ භික්ෂුවට ලෝකයේ වෙනත් රටවල ඇති පහසුකම් සියල්ලක්ම තිබේද යන්න ප්‍රශ්නයකි. විශේෂයෙන් බුරුම රටේ භික්ෂු අධ්‍යාපනය නිදහස් පසුබිමක් අනුව සකස්කර ඇති නිසා උසස් මානසික තත්වයකින් හැදෑරිය හැකිවේ.

> "ත්‍රිපිටක විභාගයෙන් සමත්වූ පසු ධර්ම භාණ්ඩාගාරික යන උපාධිය සහිත රජයේ විශේෂ සැලකිලිවලට හිමිකාරයෙක්ද වේ. එම උපාධිය ලත්පසු අහස්යානා, නැව් හා දුම්රිය ප්‍රවේශ පත්‍ර නොමිලයේ ජීවිතාන්තය දක්වා යාහැකිවන ලෙස සකස්කර ඇත. තම පුද්ගලික මෝටර් රථයේ සවිකිරීමට විශේෂ කොඩියක් රජයෙන් දේ. නෙළුම් මල් තුනක ලාංඡනය ඇති එය විශේෂ බලතල ඇති කොඩියකි."[2]

---

1. සම්පාදනය දෙවුන්දර වාචිස්සර මහ පිරිත් පොත, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1986: 29 - 33 පිටු.
2. රත්සැගොඩ සරණපාල, බුරුම රටේ අධ්‍යාපනය, බෞද්ධ සංග්‍රහය (විද්‍යොදය විශ්ව විද්‍යාලය) තුන්වෙනි කලාපය, මංගල මුද්‍රණාලය, මරදාන, 74-75 පිටු.

බෞද්ධ භික්ෂුව ගුරුවරයෙකු වශයෙන් මෙන්ම සමාජ සේවකයෙකු හා සමාජ ශෝධකයෙකු වශයෙන්ද කටයුතු කරමින් නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ අධ්‍යාපනයක් ලබා තම ගමේ නායකත්වය දරමින් විහාරස්ථානවල වැඩවසමින් ඒ ඒ ගම්වල සිදුකරනු ලබන අධ්‍යාපනික හා ආගමික කුඩා මහත් කටයුතුවලදීම මුල්තැන ගෙන ක්‍රියා කරනු ලබන ආකාරය පිළිබඳව මේ කරුණු කොටස් වශයෙන් සඟරා වල හා පොත්පත්වල පළවුවත් පූර්ණ පරීක්ෂණයක් සහිත කෘතියක් මෙතෙක් බිහිවී නැති තරම්ය. ඒ නිසාම භික්ෂුව ගමකට අවශ්‍ය වන්නේ ඇයිද යන්න පිළිබඳව ගැමියන්ගෙන්ම තොරතුරු ලබා ගැනීමට උත්සාහ කෙළෙමි. එමෙන්ම භික්ෂුව ගම හා ගමේ පාසල පිරිවෙන යන කොටස් තුන සම්බන්ධ කරමින් තුලනාත්මක පර්යේෂණයක් කිරීමට උත්සාහ ගතිමි. මෙහිදී විශේෂයෙන් ලංකාවේ දැනටමත් සීඝ්‍රයෙන් දියුණුවෙමින් පවත්නා නමුත් ගැමි පරිසරයකට නෑකම් කියන බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර මැතිවරණ කොට්ඨාශයේ පිහිටි බිබිලේගම ශ්‍රී මංගල බෝධිරාජාරාම විහාරස්ථානය, බිබිලේගම මහ විද්‍යාලය, පැරණි පිරිවෙන් සම්ප්‍රදායෙන් තරමක් ඈත්වූ වැලිමඩ කැප්පෙටිපොල ශ්‍රී සෝමානන්ද පිරිවෙන සහ පෞරාණික අධ්‍යාපනයට තැන දී කටයුතු කරන මහරගම ශ්‍රී වජිරඥාන ධර්මායතන පිරිවෙනත් අතර තුලනාත්මක විග්‍රහයක් කිරීමට උත්සාහගතිමි. මේ සඳහා මාගේ මාතෘකාවට ඉහතින් සඳහන් කළ ආයතනයන් ක්ෂේත්‍රය ලෙස තෝරා ගතිමි.

## අධ්‍යයනයේ පරමාර්ථ.

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ විධිමත් හා අවිධිමත් අධ්‍යාපන ක්‍රියාවලියේදී භික්ෂූන්වහන්සේ කෙසේ කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව සමාජ විද්‍යාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීමයි. මෙම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා බිබිලේගම පංසල වැලිමඩ උප්පෙටිපොල ශ්‍රී යෝගානන්ද පිරිවෙන, සහ මහරගම ධර්මායතන පිරිවෙන යන ආයතන තෝරා ගනිමි

මෙහි ඓතිහාසික පසුබිම යටතේ භික්ෂු අධ්‍යාපනයේ ආරම්භය පිළිබඳව හැඳින්වීමක් කෙරේ. ලංකාව පරාධීනත්වයට පත්වීමට මත්තෙන් ඉකුත්වූ කාලය මුළුල්ලේම බාල පරපුරට අකුරු කරවන පාසල වූයේ ගමේ පන්සලයි.[1] පෙරදිග භාෂා ශාස්ත්‍ර කලා ශිල්ප හා බෞද්ධ දර්ශනය උගන්වන විශ්ව විද්‍යාලය වූයේ පිරිවෙනයි.[2] භාරතයේ බෞද්ධ ශිෂ්‍යාචාරය බැබලුණු ඒ අතීතයේ එහි පැවැති වික්‍රමශිලා, නාලන්දා, ඕදන්තපුර, ආදී මහා විශ්ව විද්‍යාලයන්[3] අනු ගමනය කරමින් ලංකාවේ පිරිවෙන් විද්‍යා පීඨයන් ඇරඹුණේ අනුරාධපුර යුගයේදීය. මිහිඳු හිමියන් දවස අනුරාධපුරයෙහි පිහිටුවනු ලැබූ මහා විහාරයෙන්[4] පටන් මෑත යුගය දක්වා සෙසු බෞද්ධ රාජ්‍යයන් වෙනද ධර්ම ශාස්ත්‍රාලෝකය විහිදුවාලූ මහා විද්‍යා ප්‍රදීපයන් වූයේ පිරිවෙන්ය.

---

1 බලන්න U.D.Jayasekara, Early History of Education in Ceylon, published by the department of cultaral Affaird Ceylon 1969: P: 116.

2 බලන්න U.D.Jayasekara, Early History of Education in Ceylon P.1

3 බලන්න Radha Kumud Mookerji, Ancient Indian Education ( (Brahanical and Buddhism) Shenti Lel Jain, Delhi, 1947.

4. බලන්න:- සංස්කරණය: අමරදාස ලියනගමගේ - රණවීර ගුණවර්ධන, අනුරපුර යුගය, විද්‍යාලංකාර විශ්ව විද්‍යාල මුද්‍රණාලය, කොළඹ, 1965: 165 පිට.

"නූතන පිරිවෙන් අධ්‍යාපනයේ මූලස්ථානය රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙනයි. ඉන් අනතුරුව විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන් ඇතුළු පිරිවෙන් රාශියක් ලක්දිව ඇතිවිය."

"ඉකුත් කාලයේ නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ ධර්මශාස්ත්‍රය හා ලෝක ශාස්ත්‍රය උදෙසා අප්‍රමේය සේවයක් කළ මෙම විද්‍යෝදය විද්‍යාලංකාර මහ පිරිවෙන් දෙක උභය මන්ත්‍රී මණ්ඩලයෙන් සම්මත කරගන්නා ලද විශේෂ පනතකින්ම විශ්ව විද්‍යාල මට්ටමට පත්කිරීම ලක්දිව භාෂා සාහිත්‍යයටත් ශාසනයටත් සංස්කෘතියටත් සිදුවූ අති විශිෂ්ට සේවයක් වන්නේය.

1959 ජනවාරි 01 දින සිට මෙම පිරිවෙන් දෙක විශ්ව විද්‍යාල මට්ටමට පත්විය."[1]

මේ අනුව භික්ෂුව ලබන අධ්‍යාපනය හා සේවාවෙන් දෙනු ලබන අධ්‍යාපනය පිළිබඳව ගවේෂණයක් මෙතෙක් සිදු නොවූ නිසා ඒ පිළිබඳ අධ්‍යයනක් කිරීමට අදහස් කෙළෙමි. භික්ෂුවක් වශයෙන් අත්දැකීම් තුළින් මෙම ගවේෂණය කිරීම එක් පරමාර්ථයකි. බුද්ධකාලයේ ආරම්භවූ භික්ෂු ජීවිතය කාලානුරූපව වෙනස්වූ හැටි සහ ඒ අනුව අධ්‍යාපනයේ වෙනස්වීම පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම තවත් පරමාර්ථයක් වේ. එසේම ගම නමැති නැවේ නැවියා වශයෙන් කටයුතු කරන භික්ෂුව මුහුණපාන දුෂ්කරතා හා ඒවා විසඳා ගැනීමට භික්ෂුව කටයුතු කළයුතු ආකාරය පිළිබඳව අවධානය යොමු කොට ඇත.

---

1. මහජන ආණ්ඩුව සහ පිරිවෙන් විශ්ව විද්‍යාලයෝ, ප්‍රචාරක දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලදී, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ, 1959:1-2 පිටු.

බලන්න:- 1 K.H.M. Sumathipala, History of Education in Ceylon Tisara Prakasakayo, Ceylon, 1968: P: 24-25, P: 465 - 466.

11 ලංකාවේ අධ්‍යාපනය, සියවස ප්‍රකාශනය, 11 කාණ්ඩය, රජයේ මුද්‍රණාලය, කොළඹ, 1969: 723, 225 පිටු.

111 හැවන්පොල රතනසාර, බ්‍රිතාන්‍ය ප්‍රතිපත්ති බුද්ධසමය හා පිරිවෙන් අධ්‍යාපනය: 247-334 පිටු.